# මුල් බුදුසමයේ සත්භාවවේදී ස්ථාවරය විඥානවාදී ද ?

**සුමේධ වීරවර්ධන**[1]

ඕනෑ ම පරිපූර්ණ දාර්ශනික පද්ධතියක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ එය සත්භාවවේදී හෙවත් පැවැත්ම පිළිබඳ විග්‍රහයකින් සමන්විත වීම ය. බොහෝ බටහිර දාර්ශනික පද්ධතිවල මෙන් ක්‍රමානුකූල ව පෙළ ගැස්වුණ දාර්ශනික තේමාවන්ගෙන් සමන්විත නොවුණ ද මුල් බුදුසමය ද පරිපූර්ණ දාර්ශනික පද්ධතියකි. එබැවින් මුල් බුදුසමය තුළ ද සත්භාවවේදයක් දක්නට ලැබෙනවා පමණක් නොව එය ඊට ම ආවේණික ලක්ෂණවලින් ද යුතු වෙයි.

දැනට ප්‍රචලිත ව පිළිගැනෙන ප්‍රධාන සත්භාවවේදී සිද්ධාන්ත දෙකක් වෙයි. ඒවා වන්නේ භෞතික වාදය හා විඥාන වාදය යි. දර්ශනය පිළිබඳ උනන්දුවක් දක්වන ඇතමුන් විසින් මුල් බුදුසමයට එල්ල කරන ලද අභූත චෝදනාවක් වන්නේ මුල් බුදුසමයේ සත්භාවවේදී ස්ථාවරය විඥානවාදී ස්වභාවයක් දරන බව යි. විශේෂයෙන් ම දේශීය හා විදේශීය මාක්ස්වාදීන් විසින් කරනු ලබන මේ චෝදනාව කරුණු හරිහැටි අධ්‍යයනය කිරීමකින් තොර ව කරනු ලබන පදනම් විරහිත චෝදනාවකි.

බුදුදහම විවිධ රටවලට පැතිර යාමත් සමඟ ම බාහිර වශයෙන් පමණක් නොව කේන්ද්‍රීය සංකල්ප සම්බන්ධයෙන් ද එකිනෙකට වෙනස් ස්ථාවර දරනු ලබන විවිධ බෞද්ධ සම්ප්‍රදායයන් බිහි විය. ඒ ඒ රටවල සංස්කෘතීන්වලට අනුගත වීම සහ වෙනත් බොහෝ හේතු නිසා ඒ ඒ සම්ප්‍රදායයන් ඒවාට ම ආවේණික ස්වරූපයෙන් වර්ධනය වූ බව පෙනේ. ඒවා අතරින් යෝගාචාර විඥානවාදී බෞද්ධ ගුරුකුලය නමින් ම කියැවෙන පරිදි විඥානවාදී සත්භාවවේදී ස්ථාවරයකින් සමන්විත වේ. එහෙත් මුල්බුදුසමයේ සත්භාවවේදය විඥානවාදී වූවක් නොවේ.

---

[1] දර්ශන හා මනෝවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණි විශ්වවිද්‍යාලය, පේරාදෙණිය

මුල් බුදුසමයට අනුව මනස ද ඉන්ද්‍රියකි. මුල් බුදුසමය තුළ මනසට ලබා දී ඇති වැදගත්කම වරදවා තේරුම් ගැනීම නිසා මුල් බුදුසමය විඥානවාදී දාර්ශනික පද්ධතියක් ලෙස හැඳින්වීමට ඇතමුන් උත්සාහ කර ඇතැයි සිතිය හැකිය. එහෙත් මනසට අනෙකුත් ඉන්ද්‍රියයන්ට වඩා වැදගත් තැනක් ලබාදුන් පමණින් මුල් බුදුසමය විඥානවාදයක් ලෙස හැඳින්වීම පදනම් විරහිත ය.

කිසිදු භෞතික හෝ මානසික (නාම හෝ රූප) නිත්‍ය පදාර්ථයක පැවැත්ම මුල් බුදුසමය මඟින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට ප්‍රචලිත ප්‍රධාන සත්භාවවේදී ස්ථාවරයන්ගෙන් කවරක් පිළිගත්ත ද ඒවා ආත්මවාදී ස්ථාවරයකට වැටීම නොවැලැක්විය හැකිය. බුදු දහම අනාත්මවාදී වන බැවින් විඥානවාදී හෝ භෞතිකවාදී ස්ථාවරයක් දැරිය නොහැකි ය. බුද්ධකාලීන ව්‍යාවහාරයට අනුව විඥානවාදය, සාස්වතවාදය ලෙසත් භෞතික වාදය උච්ඡේදවාදය ලෙසත් හැඳින්වේ. මුල් බුදුසමය මඟින් උච්ඡේදවාදය මෙන් ම ශාස්වතවාදය ද ප්‍රතික්ෂේප කර ඇත.

මේ අනුව මුල් බුදුසමය පරිපූර්ණ දාර්ශනික පද්ධතියක අඩංගු විය යුතු ලක්ෂණවලින් සමන්විත වන බවත් ඊට ම ආවේණික සත්භාවවේදී විචාරයක් එහි දක්නට ලැබෙන බවත් මුල් බුදුසමයට එල්ල කරනු ලැබෙන විඥානවාදී චෝදනාව පදනම් විරහිත එකක් වන බවත් පැහැදිලි වේ.

ප්‍රමුඛ පදෑ: මුල් බුදුසමය, සත්භාවවේදය, විඥානවාදය, මාක්ස්වාදීන්ගේ විවේචනය

**Title:** Is the Buddhist Stand of Empiricism ontology Idealistic ?

**Keywords:** Empiricism ontology, Criticism of Marxists, Early Buddhist Stage